M96

# විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන්වල ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.


ඩබ්ලිව්. ඇම්. එස්. වීරකෝන්

2012/M.Phil (PT) 41

අධ්‍යාපනවේදි (පළමු පෙළ සාමාර්ථ), කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති (අධ්‍යාපන කළමනාකරණය), කොළඹ විශ්වවිද්‍යාලය


අධ්‍යාපන දර්ශනපති උපාධි වැඩසටහන-2012 සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධය.

2015 දෙසැම්බර්

UCLIB
588920

## සංක්ෂිප්තය

ඉගැන්වීම් පුහුණුව ගුරු අධ්‍යාපන වැඩසටහන්වල මූලික සහ ඉතා වැදගත් සංරචකයක් වශයෙන් හඳුනා ගන්නා අතර, එය ආධුනික ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් සළකනු ලැබේ. මෙම අධ්‍යයනය විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන්වල ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් වන අතර එමගින් කොළඹ විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. අධ්‍යයනය සඳහා අහඹු සහ සහේතුක නියැදීම යටතේ ගුරු සිසුන් 117 ක් ද, පාසල් උපාධ්‍යයවරු 30 ක්, ප්‍රමුඛාචාර්යවරු 57ක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු 5ක් ද වශයෙන් යොදා ගන්නා ලදි. අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ භාවිත වන නියැදි සමීක්ෂණ පිරිසැලස්ම යොදා ගන්නා ලද අතර, පර්යේෂණ දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා සහ වාර්තා විශ්ලේෂණය යන පර්යේෂණ උපකරණ යොදා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණ සඳහා SPSS සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්පය යොදා ගන්නා ලද අතර දත්ත අර්ථකථනයේ දී මිශ්‍ර ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙකම යොදා ගන්නා ලදි.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන්වල ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සිදුවන ස්වභාවය විමසා බැලීම, ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවේ ඵලදායිතාව කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම, ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව ක්‍රියාත්මක කිරීමේ දී එහි අධීක්ෂකයන් සහ අධීක්ෂිතයන් මුහුණ දෙන ගැටලු අනාවරණය කර ගැනීම, ප්‍රායෝගික ඉගැන්වීම් අධීක්ෂණය ඵලදායි කර ගැනීම සඳහා අධීක්ෂකයන් සහ අධීක්ෂිතයන් ඉදිරිපත් කරන යෝජනා විමසා බැලීම සහ ඉගැන්වීම් පුහුණුවේ ඵලදායිතාව හා ප්‍රමිතිකරණය සඳහා උපායමාර්ග හා නවෝත්පාදක ක්‍රමවේදයක් හඳුනා ගැනීම යන ප්‍රධාන අරමුණු පහ යටතේ යථෝක්ත අධ්‍යයනය මෙහෙය වන ලදි.

අධ්‍යයනය සඳහා සහභාගී වූ ප්‍රමුඛාචාර්යවරුන් සහ පාසල් උපාධ්‍යායවරුන් ඉහළ ප්‍රතිශතයක් ඉහළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සැපිරූ අය වූ අතර, ගුරු සිසු නියැදියේ ඉහළ ප්‍රතිශතයක් ගුරු වෘත්තියේ අඩු සේවාකාලයක් සහිත ආධුනික ගුරුවරුන් විය. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහනේ ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව යථෝක්ත විශ්වවිද්‍යාල දෙකෙහි ම එකිනෙට සමාන මෙන්ම වෙනස් අංග සහිතව ක්‍රියාත්මක වන බව හඳුනා ගත් අතර, ප්‍රායෝගික ඉගැන්ම් පුහුණුවට අදාළ සැසිවල/දේශනවල ගුණාත්මකභාවය, විශ්වවිද්‍යාලයේ දේශනවලින්/දිනපාසල්වලින් ලැබෙන න්‍යායාත්මක දැනුම සහ උපදෙස්, ගුරු සිසුන් ඉගැන්වීම් පුහුණුවේ නිරත වන පාසලේ සහයෝගි වාතාවරණය, පාසල් උපාධ්‍යායවරුන්ගේ සහ ප්‍රමුඛාචාර්යවරුන්ගේ භූමිකාවේ කාර්යක්ෂමතාව සහ ඉගැන්ම් පුහුණුව සඳහා වන ගුරු සිසුන්ගේ කැපවීම සහ උනන්දුව යන සාධක ගුරු ශිෂ්‍ය පාර්ශවයෙන් ඉගැන්වීම් පුහුණුවේ ඵලදායිතාව සඳහා බලපාන ප්‍රධාන සාධක වශයෙන් හඳුනාගන්නා ලදි.

විදුහල්පතිවරයා ගේ සහයෝගය සහ අභිප්‍රේරණය, ඉගැන්වීම සම්බන්ධ ඔහුගේ/ඇයගේ ස්වයං අත්දැකීම් හුවමාරු කර ගැනීම, ගුරු සිසුන්ගේ අවශ්‍යතාව පරිදි නියමිත කාලසටහන් හා පන්ති ලබා දීමට කටයුතු කිරීම, ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් සැපයීම, උපාධ්‍යායවරයාට ප්‍රමුඛාචාර්යවරයාට අවශ්‍ය සහයෝගය ලබා දීම සහ පාසල් පාදක ව්‍යාපෘතිය/නිබන්ධනය සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීම යන දෑ පාසලේ සහයෝගී වාතාවරණය යටතේ ගුරු සිසුන් තම පාසල් ප්‍රධානීන්ගෙන් අපේක්ෂා කළ තත්ත්වයන් වශයෙන් හඳුනා ගන්නා ලද අතර, එම තත්ත්වයන් සම්බන්ධයෙන් තම පාසල් ප්‍රධානීන් ඉහළ මට්ටමින් සහායෝගය ලබා දී ඇති බව ගුරු සිසු ප්‍රතිචාර තුළින් අනාවරණය විය. තම ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවේ සාර්ථකත්වය සඳහා පාසල් උපාධ්‍යායවරු ඉහළ මට්ටමින් සහයෝගය ලබා දුන් බවත් සමස්තයක් ලෙස තම උපාධ්‍යායවරයාගේ භූමිකාව සම්බන්ධයෙන් ගුරු සිසුන් වශයෙන් තමන් තෘප්තිමත් බවත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ගුරු සිසු නියැදියේ ඉහළ ප්‍රතිශතයක් (සියයට 70-80) අනාවරණය කළ අතර, ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවේ දී තම ඉගැන්වීම් කුසලතා සංවර්ධනය සඳහා ප්‍රමුඛාචාර්යවරු ඉහළ මට්ටමේ දායකත්වයක් ලබා දුන් බව ආයතන දෙකෙහිම ගුරු සිසුන් පිළිගත්තා ලදි.

උපාධ්‍යාය භූමිකාව සම්බන්ධයෙන් තම රාජකාරි කටයුතු, ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ අත්දැකීම්, පෞද්ගලික වගකීම්, කාල කළමනාකරණය වැනි සාධක ධනාත්මක හා ඍණාත්මක වශයෙන් බලපාන ලද බවත්, තම පාසල් ප්‍රධානීන්ගෙන් ලද සහයෝගය සහ විශ්වවිද්‍යාල මඟින් ලද උපදෙස් සහ මාර්ගෝපදේශයන් අදාළ භූමිකාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට බලපාන ලද බවත් පාසල් උපාධ්‍යායවරන් සහ ප්‍රමුඛාචාර්වරුන් විසින් අනාවරණය කරන ලදි. ඉගැන්වීම් පුහුණු කාල සීමාවේ තම උපාධ්‍යායනයට භාජනය වු ගුරු සිසුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සතුටුදායක මට්ටමක පැවති බවත් විෂය සමගාමී කටයුතු සඳහා සහභාගීත්වය සහ පාසලේ ඇති සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගැනීම ආදිය සම්බන්ධයෙන් තම ගුරු සිසුන්ගේ කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවති බවත් පාසල් උපාධ්‍යායවරන් අනාවරණයකරන ලදි.

ඉගැන්වීම් පුහුණු කාල සීමාවේ තම අධීක්ෂණයට භාජනය වු ගුරු සිසුන්ගේ ඉගැන්වීම් කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවති බව ප්‍රමුඛාචාර්ය නියදියේ සියයට 60 පමණ ප්‍රතිශතයක් ප්‍රකාශ කරන ලදි. ඉගැන්වීම් පුහුණුවේ පළමු අදියරේ ගුරු සිසුන්ගේ කර්ය සාධනයේ මට්ටම විමසීම සඳහා ඉගැන්වීම් පුහුණුව සඳහා ලබා ගත් අවසාන ලකුණු විශ්ලේෂණය කරන ලද අතර ඒ අනුව ආයතන දෙකෙහි ම ගුරු සිසුන්ගේ සමාන්‍ය ලකුණ 63 ක් ලෙස අනාවරණය විය. අධ්‍යයනයට පාදක වු ආයතන දෙක තම ගුරු පුහුණු වැඩසටහන සඳහා පුහුණු විධි දෙකක් අනුගමනය කළ ද ඉගැන්වීම් පුහුණුව පළමු අදියර තුළ ගුරු සිසුන්ගේ කාර්ය සාධනය හා පුහුණු විධිය අතර සම්බන්ධතාවක් නොමැති බව කයි වර්ග පරීක්ෂාවෙන් අනාවරණය විය.

ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව ක්‍රියාත්මක කිරීමේ දී පාසලේ බාහිර ක්‍රියාකාරකම් හේතුවෙන් ඉගැන්වීම් පුහුණුවට බාධා ඇති වීම, අධීක්ෂණය අවස්ථාවල යාබද පන්තිකාමරවල අධික ඝෝෂාව බාධා කාරී වීම, අධික සිසු තදබදය හේතුවෙන් පන්තිකාමර කළමනාකරණයට ඇතිවන බාධාවන්, පන්තිකාමරවල සීමිත ඉඩ පහසුකම්, ගුණාත්මක යෙදවුම් ඇතුළු අනෙකුත් පහසුකම්වල හිඟය හේතුවෙන් ඉගෙනුම් ද්‍රව්‍ය සඳහා අමතර වියදමක් දැරීමට සිදුවීම, විශ්වවිද්‍යාල මඟින් පාසල් ප්‍රධානීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් නොකිරීම සහ ගැටලු අවස්ථාවල අදාළ සම්බන්ධීකාරකවරුන් සම්බන්ධ කර ගැනීමේ අපහසුතාව වැනි ගැටලුවලට මුහුණ දුන් බව ගුරු සිසුන් විසින් අනාවරණය කරන ලදි.

තම භූමිකාවේ කටයුතු ඉටු කිරීමේ දී කාලය කළමනාකරණය පිළිබඳ ගැටලුව, ලියකියවිලි/වාර්තා සම්පූර්ණ කිරීම සඳහා විශාල කාලයක් වැය කිරීමට සිදුවීම, ඉගැන්වීම් පුහුණු කාලසීමාවේ විශ්වවිද්‍යාලය හා උපාධ්‍යායවරුන් අතර දුර්වල සම්බන්ධීකරණය උපාධ්‍යායවරුන් සඳහා කරන ගෙවීම් ප්‍රමාදවීම ආදිය ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව ක්‍රියාත්මක කිරීමේ දී පාසල් උපාධ්‍යායවරුන් මුහුණ දුන් ගැටලු වශයෙන් අනාවරණය වූ අතර රාජකාරි නිවාඩු ලබා ගැනීම, රැකියාවේ කාර්යබහුලත්වය, අධීක්ෂණය සඳහා ලබා දෙන කාලය ප්‍රමාණවත් නොවීම, මූල්‍ය දීමනා නිසි වේලාවට නොගෙවීම සහ තමන් ඇගයීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් නොමැතිවීම ආදි ගැටලුවලට මුහුණ දුන් බව ප්‍රමුඛාචාර්යවරුන් අනාවරණය කරන ලදි.

ප්‍රායෝගික ඉගැන්වීම් අධීක්ෂණය ඵලදායි කර ගැනීම සඳහා ප්‍රමුඛාචාර්යවරුන්ගේ ක්‍රියාකාරකම් නියාමනය, අධීක්ෂණය හා ඇගයීම සඳහා විෂය පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති පුද්ගලයන් පත් කිරීම, ඉගැන්වීම් පුහුණුව සඳහා ලබා දී ඇති කාල සීමාව වැඩි කිරීම, ඉගැන්වීම් පුහුණුව ක්‍රමවත් පරිදි නියාමනය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම යන යෝජනා ගුරු සිසුන්ගේ යෝජනා අතර වැදගත් විය. ඉගැන්වීම් පුහුණුවට අදාළව විශ්වවිද්‍යාලය පවත්වනු ලබන දින පාසල් සහ අනෙකුත් සැසිවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණුවට අදාළ විශ්වවිද්‍යාලයේ නියාමන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණුවට අදාළ කාලසීමාව වැඩි කිරීම. උපාධ්‍යාය පුහුණු වැඩමුළුවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණුව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණු අවධියේ පාසල සහ විශ්වවිද්‍යාලය අතර සම්බන්ධතාව වැඩි දියුණු කිරීම, උපාධ්‍යායවරන් සඳහා සාධාරණ දීමනාවක් ලබා දීම හා අදාළ දීමනා ප්‍රමාදයකින් තොරව ගෙවීමට කටයුතු කිරීම ආදි යෝජනා පාසල් උපාධ්‍යායවරුන් ඉදිරි පත් කරන ලදි.

ඉගැන්වීම් පුහුණුවට අදාළ සැසිවල/දේශනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ප්‍රමුඛාචාර්යවරුන් වාර්ෂිකව ඇගයීමට ලක් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම, ඉගැන්වීම් පුහුණුව අධීක්ෂණය සඳහා තමන්ට රාජකාරී නිවාඩු ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම, ප්‍රමුඛාචාර්යවරුන් සඳහා පුහුණු අවස්ථා වැඩි කිරීමට කටයුතු කිරීම, ප්‍රමුඛාචාර්යවරුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම අදි යෝජනා

ප්‍රායෝගික ඉගැන්වීම් අධීක්ෂණය ඵලදායි කර ගැනීම සඳහා ආයතන දෙකෙහි ම ප්‍රමුඛාචාර්යවරු ඉහළ ප්‍රතිශතයක් (සියයට 60-70) විසින් ඉදිරිපත් කරන ලදි.

මෙම අධ්‍යයනයේ දි පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවේ ඵලදායිතාව හා ප්‍රමිතිකරණය සඳහා ඉවහල් වන උපායමාර්ග වශයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ ඉගැන්වීම් පුහුණුවට අදාළ දිනපාසල්/දේශන/සැසිවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණුවට සම්බන්ධ ඇගයීම්කරුවන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම, පාසල සහ විශ්වවිද්‍යාලය අතර සහයෝගිතාව වැඩි දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණුව සඳහා ආදර්ශ පාසල්/ආදර්ශ පන්තිකාමර ස්ථාපිත කිරීම, ඉගැන්වීම් පුහුණු අධීක්ෂණ ක්‍රියාවලිය නියාමන යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම, විධිමත් ප්‍රමුඛාචාර්ය සංචිතයක් ස්ථාපිත කිරීම, ඉගැන්වීම් පුහුණුව කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන පර්යේෂණ සඳහා වන කැපවීම ඉහළ නැංවීම සහ කොළඹ විශ්වවිද්‍යාලය මඟින් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන සඳහා පාසල් උපාධ්‍යාය වැඩසටහන නැවත හඳුන්වා දීම යන උපායමාර්ග හඳුනා ගත් අතර එම උපායමාර්ග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සඳහා ඒකාබද්ධ කර ගැනීමේ වැදගත් කම ද අවධාරණය කරන ලද අතර එම උපායමාර්ග අන්තර්ගත කරන ලද නව ක්‍රමවේදය සඳහා වන සංකල්පීය රාමුවක් ඉදිරිපත් කොට ඊට අදාළ සංවිධානාත්මක ව්‍යුහය ද මෙම අධ්‍යයනයේ දි සාකච්ඡා කරන ලදි.

**Abstract**

Teaching Practice plays a significant role in teacher education progrmmes and helps to upgrade professional development of novice teachers. This study aims to study the teaching practice component of the Post Graduate Diploma in Education programmes of university of Colombo and the Open University of Sri Lanka. The study involved 117 Student Teachers, 30 School Mentors, 57 Master Teachers and 5 senior lectures who were sampled randomly and purposively. Based on the descriptive research Approaches the survey research design was selected for this study. Data were collected through questionnaire, documentary analysis and interviews and the data were analyzed using SPSS. Both quantitative and qualitative methods (Mixed Method) were used to interpret the data.

Current study has been manipulated under five main objectives. 1) To identify the nature of teaching practice component of the Post Graduate Diploma in Education Programmes. 2) To identify the factors affect to the effectiveness of teaching practice component. 3) To identify the issues faced by the supervisors and student teachers in relation to teaching practice. 4) To identify the suggestions made by the supervisors and student teaches to increase the effectiveness of the teaching practice component and 5) To identify the certain strategies and an innovative method for effectiveness and standardization of teaching practice component.

Major findings of the study are master teachers and school mentors who participated in the study were with highest educational qualification and professional in education system. Highest percentage of the student teachers' sample were novice teachers in the teacher service. Teaching practice component of the Post Graduate Diploma in Education program come into operation with similarities and disparities in both universities. It was identified that the quality of teaching practice sessions delivered by the university, pedagogical knowledge and guidance gained by the university, collaborative atmosphere of the school, effective role of school mentors and master teachers, motivation and commitment of student teachers are considered as major factors that affect to the effectiveness of teaching practice component according to the teachers' views. According to the teachers' view majority of principals had

given their fullest support to the student teaches to complete their practicum with successful manner. (80%) revealed that the school mentors and master teaches have been given their fullest support to upgrade their teaching skills and performance. Majority of student teachers mentioned that they were satisfied with regard to the role of mentors and master teachers during their practicum period. According to the school mentors certain factors that have been affected to carry out their role as mentors both positively negatively. for instance the responsibilities of their duty, knowledge and experiences, personal responsibilities and time management, support given by the school principals and specific guidance provided by the respective universities

Majority of mentors revealed that the student teaches who worked under their guidance were in satisfactory level in teaching. However the participation in co-curricular activities of the school and utilization of resources available at the school majority of students were not in satisfactory level during their practicum period. According to the master teachers level of performance of student teachers at both universities is average. In this study final marks of student teachers at teaching practice stage- I were analyzed and it was identified that average marks is 63. Although the both university used two mode of practicum (Open Distance Mode and Face to Face sessions) for their teacher education programme, it was identified that non relationship between mode of practicum and student teachers' performance.

It was identified that various issues faced by the student teachers during their practicum period. Lack of quality inputs, heavy noise of related classroom, unlimited extra activities of school, limited space of classroom etc... It was identified that various issues faced by the mentors and master teachers during teaching practice period. Issue of time management, more time consuming for document completion, poor interrelationship between mentors/master teachers and university, delay of payment etc.

Certain suggestions were made by student teachers, mentors and master teachers to increase the effectiveness of teaching practice supervision process. for instance 1. Increase the duration of teaching practice period2. Introducing proper monitoring mechanism. 3.improve the quality of university day schools and sessions,4. Improve the quality of training workshop for school mentors and master teachers 5.

Improve the inter relationship between supportive school and university during teaching practice period 6. stabilizing model school or classroom for teaching practice etc..

Certain strategies and an innovative method also identified to increase the effectiveness and standardization of teaching practice component in this study. For instance stabilizing strong collaborative school-university partnership, stabilizing professional body of master teachers, increase the training opportunities for mentors and master teachers, improve the commitment to the educational research in relation to teaching practice component. Based on that certain strategies an innovative method was identified for the effectiveness and standardization of teaching practice component. Certain conceptual frame work was designed to the new innovative method and discussed it's organizational structure in this study.